ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දීය යුධ හමුදාව **ඇමරිකානු** ඩොලර් මිලියන **5.5**ක් වටිනා හමුදාමය අයිතම ශ්‍රී ලංකා යුධ හමුදාවට ලබා දෙයි</u>

ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ඉන්දීය රජයේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 5.5ක් වටිනා හමුදාමය අයිතම ඉන්දීය යුධ හමුදාවේ මෙහෙයුම් තොගවලින් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවට ලබා දෙන ලදී. ශ්‍රී ලංකා යුධ හමුදාවේ මෙම හමුදාමය අයිතම හිඟයක් පැවති අතර එය හමුදාවේ මෙහෙයුම් සූදානමට ද බලපෑවේය. ඒ අනුව ඉන්දීය රජය මසක් ඇතුළත මෙම හදිසි අවශ්‍යතාවය සපුරාලීමට ද මෙම තොග ඉන්දීය නාවික හමුදාවේ ශර්දා නෞකාව මගින් ශ්‍රී ලංකාවට රැගෙන ඒමට ද එකඟ විය. මෙම අයිතම භාර දීමේ අවස්ථාවට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා, ශ්‍රී ලංකා රජයේ විදේශ ලේකම් එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) සම්පත් තුයියකොන්තා මැතිතුමා සහ ශ්‍රී ලංකා යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රුද්‍රිගු මැතිතුමා සහභාගී වූහ.

2. පසුගිය වසර දෙක තුළ ඉන්දියාවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ හමුදාමය සහ පුහුණු ආධාර ලබා දීම සඳහා ශ්‍රී ලංකා රුපියල් බිලියන 5ක් වටිනා ව්‍යාපෘතීන් අනුමත කර ඇත. මෙයට අමතරව, දිට්වා සුළි කුණාටුව අතරතුර ඉන්දීය යුධ හමුදාව විසින් කාර්ය මණ්ඩලයේ 80 දෙනෙකුගෙන් සමන්විත ක්ෂේත්‍ර රෝහලක් ද ලබා දුන් අතර එමගින් දෙසතියක් පුරා ශ්‍රී ලංකාවේ 7000 දෙනෙකුට අධික පිරිසකට ප්‍රතිකාර ලබා දෙන ලදී. ඉන්දීය යුධ හමුදාවේ ඉංජිනේරු බලකායන්ගේ 48 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් ද මාස හයකට වැඩි කාලයක් පුරා ශ්‍රී ලංකාවේ රැදමේන් පාලම් හතක් ඉදි කළහ. එසේම ඔවුන් විසින් හානියට පත් සියලු පාලම්වල සමීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධන අධිකාරියට ඉංජිනේරු උපදෙස් ලබා දෙන ලදී.

3. තවද, පුහුණු කටයුතු දෙරට අතර ආරක්ෂක සහයෝගීතාවයේ ශක්තිමත්ම අංගයක් වේ. සෑම වසරකම, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සාමාජිකයන් 1200 දෙනෙකු පමණ ඉන්දීය සන්නද්ධ හමුදා ආයතනවල පුහුණුව ලබති. එයට අමතරව, සෑම වසරකම

විවිධ උපදේශක පුහුණු හුවමාරු, විශේෂයෙන් සකසන ලද පාඨමාලා සහ ජංගම පුහුණු කණ්ඩායම් සඳහා ද අවස්ථාවන් හිමි වේ.

4. ඉන්දීය යුධ හමුදාව සහ ශ්‍රී ලංකා යුධ හමුදාව අතර මෑතකාලීන නියැලීම් තුළින් මිත්‍රත්වයේ ගැඹුරු බැඳීම් සහ කාර්ය සහයෝගීතාවය ශක්තිමත් වී ඇත. මෙම හමුදාමය තොග ලබා දීම තුළින් ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයතේ' සහ අග්‍රාමාත්‍යතුමාගේ මහාසාගර් යන දැක්ම හා අනුකූලව දෙරට අතර සමීප ආරක්ෂක සහයෝගීතාවය සහ එකමුතුභාවය පිළිබිඹු වේ.

***

***කොළඹ***
***2026 ජූනි 16***